# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2124/7 - 2019 මැයි මස 21 වැනි අඟහරුවාදා - 2019.05.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බින්තැන්න පත්තු දකුණ සුළු කොට්ඨාසයේ, පදියතලාව ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද පදියතලාව ටො.පො. පීපී 49 අතිරේක අංක 53 හි කැබලි අංක 3515 දරන බිම් කැබැල්ල ප්‍රමාණයෙන් හෙක්. 1.0120 වන මහබැද්දවත්ත නැමැති ඉඩම් කැබැල්ලට මායිම්:

උතුරට: කැබලි අංක 3495, 242 හා 243; නැගෙනහිරට: කැබලි අංක 242 හා 243; දකුණට: කැබලි අංක 242; බටහිරට: කැබලි අංක 242 හා 3495.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තමතමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2019 ජූනි මස 13 වැනි දින පෙ.ව 10.30 ට පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද, 2019 ජූනි මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ආර්. එම්. එන්. විජයතුංග,
ප්‍රාදේශීය ලේකම්,
පදියතලාව.

පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 25

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1A - G 30121 - 33 (2019/05)

සංශෝධනයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය :* නුඑ/3/1/8/අත්පත්/143.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංක :* 4-3/4/2014/LO/359.

අංක 2063/32 හා 2018.03.22 වැනි දින *අති විශෙෂ ගැසට්* පත්‍රයේ III කොටසේ 1A පිටුවේ පළ කරන ලද නිවේදනයේ අවසාන පරිච්ඡේද 2 පහත දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

"ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තමතමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2019 ජූනි මස 24 වැනි දින පෙ.ව 10.00 ට නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද, 2019 ජූනි මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තර කර, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩබ්. එම්. ආනන්ද,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2019 මැයි මස 15 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
නුවරඑළිය.

06 - 26

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

*මගේ අංකය :* මීරි/ප්‍රාලේ/ඉ/3/510247/434.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියට යටත්ව අංක 2012/6 හා 2017.03.27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 8එ/7ඒ පිටුවේ සඳහන් කැඩැස්තර සිතියම් 510247 කැබලි අංක 435, 434 යන කැබලි නැවත මැනීමෙන් පසු කැබලි අංක 467, 468, 469 ලෙස කොටස් තුනකට වෙන් කරන ලදී. එය පහත පරිදි සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරමි.

01. **කැබලි අංක 467**

ඉඩමේ නම: කෝන්ගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: වේයන්ගොඩ, ගල්ගමුව අංක 156 පදිංචි කපුරුබණ්ඩාර අප්පුහාමිලාගේ තරංග දයාන් කපුරුබණ්ඩාර සහ කපුරුබණ්ඩාර අප්පුහාමිලාගේ අයෝමි ශාලිකා කපුරුබණ්ඩාර; ප්‍රමාණය: හෙක්. 0.0707 (අත්කර ගැනීමේ කටයුතු අවසන් කර ගැනීම සඳහා).

02. **කැබලි අංක 468**

ඉඩමේ නම: කෝන්ගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: වේයන්ගොඩ, ගල්ගමුව පදිංචි කපුරුබණ්ඩාර අප්පුහාමිලාගේ තරංග දයාන් කපුරුබණ්ඩාර; ප්‍රමාණය: හෙක්. 0.0091 (අත්කර ගැනීමේ කටයුතු අවසන් කර ගැනීම සඳහා).

03. **කැබලි අංක 469**

ඉඩමේ නම: -; ඉඩමේ විස්තරය: පාර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: වේයන්ගොඩ, ගල්ගමුව අංක 156 පදිංචි කපුරුබණ්ඩාර අප්පුහාමිලාගේ තරංග දයාන් කපුරුබණ්ඩාර සහ කපුරුබණ්ඩාර අප්පුහාමිලාගේ අයෝමි ශාලිකා කපුරුබණ්ඩාර; ප්‍රමාණය: හෙක්. 0.0091 (අත්කර ගැනීමේ කටයුතු අවසන් කර ගැනීම සඳහා).

වයි. අයි. එම්. සිල්වා,
ප්‍රාදේශීය ලේකම්,
මීරිගම.

2019 මැයි මස 16 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මීරිගම.

06 - 27

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.